පාර්ලිමේන්තු මාලා අංකය - 35

අමාත්‍යාංශයේ නම - ආරක්ෂක අමාත්‍යාංශය

කමිටු නිර්දේශය	ගත් ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
පරිසර අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ එක්ව අලාභ හා හානි අරමුදල සඳහා අයදුම් කිරීමට දක්ත ආකෘති ඉදිරිපත් කිරීමට ක්‍රමවේදයක් සැකසීම නිර්දේශ කෙරේ.	මේ වන විට 2005 අංක 13, දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත යටතේ පැවරී ඇති බලතල අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආපදා සිදුවීම් පිළිබඳ හානි හා අලාභ පිළිබඳ දත්ත රැස් කිරීම සහ ගබඩා කිරීම සිදු කරනු ලබයි. ආපදාවලින් සිදුවන හානි හා අලාභ සහ දේශගුණික විපර්යාස හා සම්බන්ධ හානි හා අලාභ අතර වෙනසක් ඇති බැවින්, අලාභ හා හානි අරමුදල යටතේ ප්‍රකාශයට පත් කර ඇති නියමයන් සහ කොන්දේසි අනුගමනය කරමින් දත්ත රැස් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, පරිසර අමාත්‍යාංශයෙන් මාර්ගෝපදේශයක් සහ උපදේශනයක් ඉල්ලා ඇත.
සමනල වැව වේල්ලේ කාන්දුව තරයේ තක්සේරු කර කාන්දුව පිළිසකර කිරීමට පියවර ගන්නා ලෙසත්, ඒ සඳහා අවදානම් අවම කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරන ලෙසත් නිර්දේශ කෙරේ. සමනල වැව ඉවුරේ ඇති ජල කඳේ අධික පීඩනය හේතුවෙන් මීට පෙර සිදු කරන ලද බොහෝ අලුත්වැඩියාවන් සාර්ථක නොවූ බැවින් කාන්දුව නිවැරදි කිරීමට ඕනෑම පියවරක් සම්පූර්ණ අධ්‍යයනයකින් පසුව සිදු කළ යුතුය.	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රත්නපුර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මඟින් අවදානමට ලක්විය හැකි ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා සූදානම් වීම, පූර්ව අනතුරු ඇඟවීම් සහ අපේක්ෂිත අවදානම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම වැනි ව්‍යුහාත්මක නොවන අවම කිරීමේ ක්‍රියාමාර්ග හරහා අවදානම් අවම කිරීම සිදු කරන ලදී.
කිසියම් කාන්දුවක් ග්‍රාම සේවා වසම් 12 ක පවුල් 2000 කට ආසන්න පිරිසකට බලපාන අතර වගා බිම් 3000 කට ආසන්න ප්‍රමාණයකට බලපාන බැවින් සමනල වැව වේල්ල ආශ්‍රිත ප්‍රදේශයේ ජනතාවට ඕනෑම අනතුරක් පිළිබඳව දැනුවත් කිරීම සඳහා තක්ෂ කාලීන නිරීක්ෂණ සහ අනතුරු ඇඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ආපදා කළමනාකරණ කමිටු පිහිටුවා ඇති අතර නිබන්ධන කමිටු සමනල වැව වේල්ල ඉංජිනේරු කාර්යාලය සහ කල්කොට පොලිසිය සමඟ සම්බන්ධ කර ඇති අතර තවදුරටත් ප්‍රජා මට්ටමින් පූර්ව අනතුරු ඇඟවීම් බෙදා හැරීමේ යාන්ත්‍රණය ද ස්ථාපිත කරන ලදී.
සමනල වැවේ වේල්ල කාන්දු වීම සම්බන්ධයෙන් පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහනක් සකස් කිරීම නිර්දේශ කෙරේ. අනාගත විපක් සඳහා සූදානම් වීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සමීප සම්බන්ධීකරණයක් මෙයට ඇතුළත් විය යුතුය.	අවදානමට ලක්විය හැකි ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා සූදානම් කිරීමේ සැලසුම් අවසන් කර ඇති අතර පූර්ව අනතුරු ඇඟවීම්, ඉවත් කිරීම ඇතුළු ප්‍රතිචාර ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම අවසන් කර ඇත.

අත්සන් කළේ
රනිල් වික්‍රමසිංහ
ආරක්ෂක අමාත්‍ය